(ආ) ආර්ථික අපහසුකම් මත අධ්‍යාපන පහසුකම් නොලබන දරු දැරියන්ට පෙර පාසල්, ප්‍රාථමික, ද්විතීයික සහ තෘතීක මට්ටමේ අධ්‍යාපන පහසුකම් සැපයීමට කටයුතු කිරීම;

(ඇ) පාරම්පරික සංස්කෘතික කලාවන් ආරක්ෂා කිරීම සඳහා ඒ ඒ කලා ශිල්පීන් ආරක්ෂා කිරීම, ඇගයීම, පහසුකම් සැපයීම, දිරිගැන්වීම හා ඔවුන්ගේ අභිවෘද්ධියට කටයුතු කිරීම;

(ඈ) තරුණ තරුණියන්ගේ නායකත්වය හා පෞරුෂය වර්ධනය කිරීම තුළින් ස්වකීය අභිමානය ඔප්නංවන කුසලතා සංවර්ධනයට අදාළ වෘත්තීය පුහුණු අවස්ථා සැලසීම;

(ඉ) තරුණ ශ්‍රමය හා තරුණ ජවය කාර්යක්ෂම හා ඵලදායී ලෙස ජාතික අභිවෘද්ධිය සඳහා යොදවා ගැනීමට අවශ්‍ය පහසුකම් සැකසීම හා ඊට දායක වීම;

(ඊ) අඩු පහසුකම් හා පහසුකම් නොමැති ග්‍රාමීය මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම. ඒ තුළින් සහජ හැකියාවන් හා දක්ෂතාවයන් හඳුනාගෙන ඔවුන් ජාතික හා ජාත්‍යන්තර තලය දක්වා ගෙනයාමට අවශ්‍ය මූල්‍ය හා තාක්ෂණික පහසුකම් සපයා දීමට කටයුතු කිරීම;

(උ) ජනතාව කේන්ද්‍ර කරගත් පරිසර කළමනාකාරීත්වයක් ගොඩනැගීමට අවශ්‍ය කටයුතු කිරීම;

(ඌ) ගොවි ආර්ථිකය නංවාලීම සඳහා දියුණු තාක්ෂණික ක්‍රමෝපායන් හඳුන්වා දීම, විවිධාංගීකරණය කිරීම සහ ආර්ථිකය කළමනාකරණය පිළිබඳව දැනුම හා අවබෝධය ලබා දීමට කටයුතු කිරීම;

(එ) ග්‍රාමීය ණයගැති භාවය අවම කිරීම සඳහා ඉතිරි කිරීම ප්‍රවර්ධනය කිරීමටත්, අවශ්‍යතා මත පහසුවෙන් ණය ලබා ගත හැකි ජනතා සහභාගීත්වයෙන් ගොඩනැගුන මූල්‍යායතන පිහිටුවීම, වැඩිදියුණු කිරීම හා දිරිගැන්වීම තුළින් ජනතා සුභසාධනය සඳහා කටයුතු කිරීම;

(ඒ) සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (මහා පරිමාණ කර්මාන්ත විසින් පෝෂණය කරන හා ස්වාධීන) ප්‍රවර්ධනය කිරීම සඳහා උපකාර කිරීම, දිරිගැන්වීම හා ව්‍යවසායකත්වය වර්ධනය කිරීම; සහ

